**ඒඩ්ස්, ක්ෂය රෝගය හා මැලේරියාව මර්දනය කිරීම සඳහා වූ ගෝලීය අරමුදල් (ජීඑෆ්ඒටීඑම්) ව්‍යාපෘතියේ ඒඩ්ස් සංරචකය 9 වන වටය 2013**

---

ඒඩ්ස්, ක්ෂය රෝගය හා මැලේරියාව මර්දනය කිරීම සඳහාවූ ගෝලීය අරමුදල් (ජීඑෆ්ඒටීඑම්) ව්‍යාපෘතියේ ඒඩ්ස් සංරචකය 9 වන වටය 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය (ශ්‍රීලංර) සහ ඒඩ්ස් , ක්ෂය රෝගය හා මැලේරියාව මර්දනය කිරීම සඳහා වූ ගෝලීය අරමුදල (ජීඑෆ්ඒටීඑම්) අතර 2011 පෙබරවාරි 11 දින එළඹි අංක එස්ආර්එල්-එස් - 11 - ජී 13 - එච් දරන ප්‍රදාන ගිවිසුමේ 13(ආ) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---

ප්‍රදාන ගිවිසුම අනුව, ව්‍යාපෘති විෂය පථය හා කාර්යයන්, අයවැය ලේඛන, ඉලක්ක සහ දර්ශක ඇතුළු ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීම හා ක්‍රියාත්මක කිරීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය වගකීම දරයි. ශ්‍රී ලංකාවේ එච්අයිවී / ඒඩ්ස් වැළැක්වීම, පාලනය හා ප්‍රතිකාර කිරීම සඳහා ජාතික වැඩ සටහනේ කාර්යයන් ඉහළ නැංවීම ව්‍යාපෘතියේ අරමුණු වේ. ප්‍රදාන ගිවිසුම අනුව, එච්අයිවී/ඒඩ්ස් පාලන ව්‍යාපෘතියේ 6 වන වටය හා 9 වන වටය සඳහා ඇස්තමේන්තුගත මුළු පිරිවැය පිළිවෙලින් එජඩො 1,300,923 ක් එජඩො 4,956,930 ක් වන අතර සම්පූර්ණ මුදලම මූල්‍යයනය කිරීමට ඒඩ්ස්, ක්ෂය රෝගය හා මැලේරියාව මර්දනය කිරීම සඳහා වූ ගෝලීය අරමුදල එකඟවී තිබුණි. 2008 ජනවාරි 01 දින ව්‍යාපෘතිය එහි කටයුතු ආරම්භ කරන ලද අතර 06 වන වටය වැඩ සටහන 2010 දෙසැම්බර් 31 වන විට නිම කිරීමට නියමිත විය. 09 වටය වැඩ සටහන 2015 දෙසැම්බර් 31 වන විට නිම කිරීමට නියමිතය.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත්, යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරාගැනීම සහ යොදාගැනීමත් අවස්ථාවෝචිතව සාධාරණ ලෙස ගිණුම්කරණ ඇස්තමේන්තු සකස් කිරීමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. විගණන විෂය පථය හා මතය සඳහා පදනම

---

මාගේ විගණන පරීක්ෂණ මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මෙම වාර්තාවේ ඇතුළත් විගණන මතය, අදහස් දැක්වීම් සහ සොයාගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් සහ කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි. මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන සාක්ෂි නියැදි පදනම මත පරීක්ෂා කිරීම්, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති හා වැදගත් ඇස්තමේන්තු සහ මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ උපරිම දැනීම සහ විශ්වාසය පරිදි විගණන කටයුතු සඳහා අවශ්‍ය වන ප්‍රමාණවත් තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලදී.

ඒ අනුව මාගේ මතය සඳහා ප්‍රමාණවත් පදනමක් මාගේ විගණනය මගින් සපයන බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීම පිණිස අවශ්‍ය යැයි සලකනු ලැබූ පද්ධති හා පාලන , ගනුදෙනු, වත්කම්, වගකීම් හා ගිණුම් වාර්තා පිළිබඳ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසවන්තභාවය තහවුරු කිරීමට හැකිවන පරිදි පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම්, ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යනු ලබන විස්තරාත්මක මූල්‍ය වාර්තා සහ ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඇ) ශ්‍රී ලංකා රජයෙන් සහ අරමුදල් සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම් , මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම්වලින් උද්ගත වූ වත්කම් සහ වගකීම් ප්‍රදාන යටතේ මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) ප්‍රදාන යටතේ ආපසු ගැනීම් ප්‍රදාන ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඉ) ප්‍රදාන යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදාගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(උ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(ඌ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව.

(ඌ) ප්‍රදාන ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

**3. මතය**

--------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මෙම වාර්තාවේ 5 ඡේදයේ දැක්වෙන කරුණුවලින් උද්ගත වන ගැටළුවලින් ඇති වන බලපෑම් හැර, මාගේ මතය වනුයේ ,

(අ) 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව, 2013 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඈ) ප්‍රදාන ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත් ය.

## 4. මූල්‍ය ප්‍රකාශන

------------------

### 4.1 මූල්‍ය කාර්ය සාධනය

-------------------------

මූල්‍ය ප්‍රකාශන හා ලබා ගත හැකි වූ තොරතුරු අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘති වියදම රු.82,354,428 (එජඩො 636,901) ක් වූ අතර 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම රු.346,562,103 ක් විය. සමාලෝචිත වර්ෂය සඳහා වියදම, ඉකුත් වර්ෂය සඳහා වියදම සහ 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

| වර්ගය | දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම | | | | 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම |
|---|---|---|---|---|---|
| -------- | ---------- | | | | ---------- |
| | 2013 | | 2012 | | |
| | එජඩො | රු. | එජඩො | රු. | රු. |
| දේපල, පිරියත හා උපකරණ | 79,127 | 10,345,861 | 246,842 | 31,388,458 | 62,234,301 |
| එච්අයිවී / ඒඩ්ස් පාලන කාර්යයන් | 557,774 | 72,008,567 | 620,153 | 79,131,478 | 284,327,862 |
| | ----------- | ------------- | ---------- | ------------- | --------------- |
| | 636,901 | 82,354,428 | 866,995 | 110,519,936 | 346,562,163 |

## 4.2 මුදල් ප්‍රවාහය

2012 සහ 2013 වර්ෂ සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව මුදල් ප්‍රවාහයෙහි තත්ත්වය පහත දැක්වේ.

| **මෙහෙයුම් කටයුතු වලින් මුදල් ප්‍රවාහය** | **2013 වර්ෂය සඳහා** | | **2012 වර්ෂය සඳහා** | |
|---|---|---|---|---|
| | **එජඩො** | **රු.** | **එජඩො** | **රු.** |
| විදේශාධාර ප්‍රදාන වලින් ලද මුදල් (වැය සම්මතය- 13) | 526,723 | 68,000,000 | 916,928 | 117,000,000 |
| දේශීය අරමුදල් ආශ්‍රිත විදේශාධාර - (වැය සම්මත -17) | 77,459 | 10,000,000 | 78,370 | 10,000,000 |
| ලංසු ආදායමෙන් ලද මුදල් | - | - | 435 | 55,500 |
| වැඩ සටහන් වියදම් සඳහා ගෙවූ මුදල් | (557,774) | (72,008,567) | (620,153) | (79,131,477) |
| වෙනස | 2 | 2 | - | - |
| අත්තිකාරම් ( ශුද්ධ ) | 69,925 | 9,141,188 | - | (6,860,451) |
| ආපසු ගෙවිය යුතු තැන්පතු | - | 1,500 | - | - |
| විදේශ විනිමය (පාඩුව )වාසිය | (586) | - | 1,300 | - |
| මෙහෙයුම් කටයුතුවලින් ශුද්ධ මුදල් | 115,749 | 15,134,121 | 322,928 | 41,063,571 |
| **ආයෝජන කටයුතු වලින් මුදල් ප්‍රවාහය** | | | | |
| ස්ථාවර වත්කම් | (79,127) | (10,345,861) | (246,842) | (31,388,458) |
| ආයෝජන කටයුතුවල යෙදු ශුද්ධ මුදල් | (79,127) | (10,345,861) | (246,842) | (31,388,458) |
| **මූල්‍ය කටයුතුවලින් මුදල් ප්‍රවාහය** | | | | |
| මහා භාණ්ඩාගාරයට ආපසු ගෙවන ලද මුදල් | (36,621) | (4,788,260) | (76,086) | (9,675,114) |
| මුදල්වල ශුද්ධ වැඩිවීම | - | - | - | - |

**5. විගණන නිරීක්ෂණ**

**5.1 නොසැසඳූ පාලන ගිණුම්**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ගිණුම අනුව, වැඩ සටහන් 5 ක් යටතේ සිදුකරන ලද එච්අයිවී/ඒඩ්ස් වැළැක්වීමේ කාර්යයන් සඳහා රු.3,376,433 ක මුදලක් වැයකර තිබුණි. කෙසේ වුවද ව්‍යාපෘතිය විසින් පවත්වා ගනු ලැබූ වාර්තාවලට අනුව, ඒ සඳහා පිරිවැය රු.2,740,036 ක් ලෙස දක්වා තිබුණි.

(ආ) ගිණුම අනුව "Prison Inmate Peer Educators for Behaviour Change " පිළිබඳ පුහුණු වැඩ සටහන සඳහා රු.529,786 ක මුදලක් වැයකර තිබුණි. කෙසේ වුවද ව්‍යාපෘතියේ පුහුණු ඒකකයේ පවත්වා ගනු ලැබූ වාර්තා අනුව එය රු.398,625 ක් ලෙස දැක්වුණි.

**5.2 නීති, රීති, රෙගුලාසි ආදියට අනුකූල නොවීම**

විගණනයේදී නිරීක්ෂණය වූ අනුකූල නොවීම් අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | <u>මුදල් රෙගුලාසි</u> | |
| (i). | මුදල් රෙගුලාසි 135 හා 2013 ජනවාරි 21 දිනැති අංක එස්එෆ්ඒ/01/2013 දරන සෞඛ්‍ය අමාත්‍යාංශ චක්‍රලේඛය | ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් ගෙවීම් අනුමත කළ යුතු සීමාව රු.2,000,000 ක් විය. එහෙත් එම සීමාවට පටහැනිව ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් අවස්ථා 8 කදී එකතුව රු.42,257,936 ක ගෙවීම් අනුමත කර තිබුණි. කෙසේ වුවද 2014 ඔක්තෝබර් මාසයේදී සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් මේ සඳහා ආවරණ අනුමැතිය ලබාදී තිබුණි. |
| (ii). | මුදල් රෙගුලාසි 371(2) | අත්තිකාරම් ලබාදී තිබූ කාර්යය නිම කළ වහාම අත්තිකාරම් නිරවුල් කළ යුතු වුවද, අවස්ථා 43 කදී ලබාදී තිබූ රු.13,555,268 ක් වූ අත්තිකාරම් මාස 02 සිට මාස 12 දක්වා ප්‍රමාදයන් සහිතව නිරවුල් කර තිබුණි. |
| (iii). | මුදල් රෙගුලාසි 756 සහ 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | රු.62,234,301 ක් වටිනාකම වූ ස්ථාවර වත්කම් සමාලෝචිත වර්ෂය සඳහා සත්‍යාපනය කර නොතිබුණි. |

**5.3 විගණනය සඳහා සාක්ෂි නොවීම**

-----------------------------------

පහත සඳහන් අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) රු.8,661,211 පිරිවැයකට පාරිභෝගික අයිතම හා රසායනාගාර උපකරණ දෙකක් ආනයනය කිරීම සඳහා සුවඳ විලවුන්, උපකරණ හා ඖෂධ අධිකාරිය විසින් නිකුත් කරන ලද සහතිකවල පිටපත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) එච්අයිවී/ඒඩ්ස් වැළැක්වීමේ කාර්යයන් සම්බන්ධයෙන් දරන ලද එකතුව රු.3,815,724 ක් වූ වියදම් පිළිබඳ නිරවුල් කිරීමේ වවුචර් තුනක් හා අදාළ ලියකියවිලි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**6. මූල්‍ය හා භෞතික කාර්ය සාධනය**

------------------------------------

**6.1 අරමුදල් උපයෝජනය**

-----------------------

අරමුදල් මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය සහ සමාලෝචිත වර්ෂය තුළ හා 2013 දෙසැම්බර් 31 දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන පහත දැක්වේ.

| ප්‍රභවය | ප්‍රදාන ගිවිසුමේ මූල්‍යයනය සඳහා එකඟ වූ මුදල | | 2013 වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය | වර්ෂය තුළ ලැබුණු අරමුදල් | | 2013 වර්ෂය තුළ උපයෝජනය කළ අරමුදල් | | 2013 දෙසැම්බර් 31 දක්වා උපයෝජනය කළ අරමුදල් | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | එජ ඩො මිලියන | රු.මිලියන | රු.මිලියන | එජ ඩො මිලියන | රු.මිලියන | එජ ඩො මිලියන | රු.මිලියන | එජ ඩො මිලියන | රු.මිලියන |
| ජීඑෆ්ඒටීඑම් | 4.956 | 629.46 | 192.15 | 0.526 | *92.96 | 0.70 | *66.54 | 1.973 | 246.45 |
| ශ්‍රී ලං ර | - | - | - | - | 10.00 | - | - | - | - |
| | <u>4.956</u> | <u>629.46</u> | <u>192.15</u> | <u>0.526</u> | <u>102.96</u> | <u>0.70</u> | <u>66.54</u> | <u>1.973</u> | <u>246.45</u> |

* රු.මිලියන 24.96 ක් වූ සෘජු වියපැහැදම් ඇතුළත් කරන ලදි.

රු.මිලියන 101 කට සමාන එජඩො 0.779 ක මුදලක් සමාලෝචිත වර්ෂය තුළදී මහා භාණ්ඩාගාරයට ලැබී තිබුණද, රු.මිලියන 68 ක මුදලක් පමණක් ව්‍යාපෘතියට මුදා හැර තිබුණු අතර ව්‍යාපෘතිය විසින් ඉන් රු.මිලයන 66.54 ක් පමණක් උපයෝජනය කර තිබුණි. තවද ව්‍යාපෘතියේ විස්තරාත්මක කාර්ය වැඩ සටහනට අනුව, 2011 සිට 2013 කාල පරිච්ඡේදය තුළ ගෝලීය අරමුදල විසින් එජඩො මිලියන 3 ක් මුදාහැරීමට අපේක්ෂා කර තිබූ අතර ඉන් එජඩො මිලියන 2.78 ක් 2013 දෙසැම්බර් 31 දිනට මුදාහැර තිබුණි. 2013 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘති කාලපරිච්ඡේදයෙන් සියයට 60 ක් ඉකුත් වීමෙන් පසුව

ව්‍යාපෘතිය විසින් එජඩො මිලියන 1.97 ක මුදලක් උපයෝජනය කර තිබුණි. එබැවින් ඉතිරි මාස 24 ක කාලපරිච්ඡේදය තුළදී ප්‍රදානයෙන් ඉතිරි වන එජඩො මිලියන 2.9 ක මුදල උපයෝජනය කළ හැකිවේද යන්න සැක සහිතය.

## 6.2 භෞතික කාර්ය සාධනය

----------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා කාර්යයන් 20 ක් වෙනුවෙන් වෙන්කරන ලද එකතුව රු.54,040,063 ක මුදල් අරමුණු කළ කාර්යයන් සඳහා උපයෝජනය කර නොතිබුණි. තවද අදාළ අධිකාරින්ගෙන් විධිමත් අනුමැතියක් ලබා ගැනීමෙන් තොරව වෙනත් කාර්යයන් 07 ක් සඳහා රු.18,310,076 ක් දරා තිබුණි. එයින් රු.979,059 ක මුදලක්, ව්‍යාපෘතියේ වාර්ෂික අයවැය ලේඛනයේ ප්‍රතිපාදන සැලසීමෙන් තොරව සමාලෝචිත වර්ෂය තුළදී කාර්යයන් 02 ක් සඳහා දරා තිබුණි.

(ආ) කාර්යයන් 16 ක් සඳහා රු.64,099,989 ක මුදලක් සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික අයවැය ලේඛනයේ වෙන්කර තිබුණද, 2013 දෙසැම්බර් 31 දිනට රු.9,418,058 ක මුදලක් පමණක් උපයෝජනය කර තිබුණි.

(ඇ) ලැබුණු මුළු ප්‍රදාන මුදල්වලින් රු.4,788,260 ක මුදලක් ව්‍යාපෘතියේ අරමුණු කළ කාර්යයන් සඳහා උපයෝජනය කිරීමෙන් තොරව සමාලෝචිත වර්ෂය අවසානයට මහා භාණ්ඩාගාරයට ආපසු යවා තිබුණි.

(ඈ) තායිලන්තයේ පැවති පුහුණු වැඩ මුළුවකට අදාළව ලියාපදිංචි ගාස්තු ගෙවීමේ ප්‍රමාදය හේතුවෙන්, අතිරේක වශයෙන් රු.93,485 ක මුදලක් ගෙවා තිබූ බව නිරීක්ෂණය විය.

## 7. පද්ධති හා පාලන

---------------------

පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතු වේ.

(අ) භාණ්ඩ ප්‍රසම්පාදනය

(ආ) තොග

(ඇ) අරමුදල් උපයෝජනය

(ඈ) අග්‍රිම හා අත්තිකාරම් නිරවුල් කිරීම

(ඉ) ගිණුම්කරණය